# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2006/16 – 2017 පෙබරවාරි 14 වැනි අඟහරුවාදා – 2017.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ, පුවක්දන්ඩාව (අ.ග.පි.308) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක එච්/සීජීආර්/බීඑල්ඒ/2014/601 හා 2014.12.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක් 0.0398 ක් පමණ වන ඉඩම් කොටස්වලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – සන්නාසිගෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0084
උතුරට : දුම්රිය දෙපාර්තමේන්තුව හිමිකම් කියන ඉඩම සහ කේ. එච්. බන්දුවතී හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට : කේ. එච්. බන්දුවතී හිමිකම් කියන ඉඩම සහ කේ. ඒ. පියදාස හිමිකම් කියන ඉඩම; දකුණට : කේ. ඒ. පියදාස හිමිකම් කියන ඉඩම, ජී. අලහප්පෙරුම හිමිකම් කියන ඉඩම සහ කැබලි අක්ෂර බී ; බටහිරට : කැබලි අක්ෂර බී සහ දුම්රිය දෙපාර්තමේන්තුව හිමිකම් කියන ඉඩම.

02. කැබලි අක්ෂර 'බී' – කොරිගෙවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0314
උතුරට : දුම්රිය දෙපාර්තමේන්තුව හිමිකම් කියන ඉඩම සහ කැබලි අක්ෂර ඒ ; නැගෙනහිරට : කැබලි අක්ෂර ඒ, කේ. ඒ. පියදාස හිමිකම් කියන ඉඩම සහ ජී. අලහප්පෙරුම හිමිකම් කියන ඉඩම ; දකුණට : ජී. අලහප්පෙරුම හිමිකම් කියන ඉඩම සහ මාර්ගය ; බටහිරට : මාර්ගය සහ දුම්රිය දෙපාර්තමේන්තුව හිමිකම් කියන ඉඩම.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/11/2013/එන්ආර්ඩී/672.
2016 සැප්තැම්බර් මස 26 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 39

1A – G 25129 – 12 (2017/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*